# බහුවිධ මාධ්‍ය භාවිතය

## සිංහල

## 11 ශ්‍රේණිය

## II වාරය

**නිපුණතාව** :- 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනී

**නිපුණතා මට්ටම** :- 1.7 බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල** :-

- ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය හඳුනාගෙන විස්තර කරයි.
- ඉදිරිපත් කිරීම් සඳහා බහුවිධ මාධ්‍ය යොදා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ඉදිරිපත් කිරීමේ දී බහුවිධ මාධ්‍ය නිවැරදි ව භාවිත කරයි.
- තාක්ෂණික මෙවලම් හැසිරවීමේ හුරුව ප්‍රදර්ශනය කරයි.

### බහුවිධ මාධ්‍ය කිහිපයක්




**පෝස්ටර්**



**භූමිකා රංගන**



**බහුවිධ ප්‍රක්ෂේපකය**



**උඩිස් ප්‍රක්ෂේපකය**

## ක්‍රියාකාරකම- 1

➢ **කෙටි පිළිතුරු සපයන්න.**

1. අකුරු විවිධ වර්ණයෙන් හා හැඩයෙන් භාවිත කර සකස් කර ගන්නා ඉදිරිපත් කිරීමේ ක්‍රමය කුමක් ද ?

   ........................................................................................................................

   .

2. කඩදාසි ලේඛන පෙරළමින් කරන ඉදිරිපත් කිරීම් උපකරණ කුමක් ද ?

   ........................................................................................................................

3. සජීවී ලෙස චරිත යොදා ගෙන කරන ඉදිරිපත් කිරීමේ ක්‍රමය කුමක් ද ?

   ........................................................................................................................

4. මුද්‍රිත ලේඛන විද්‍යුත් ආලෝකය භාවිතයෙන් ඉදිරිපත් කරන උපකරණය නම් කරන්න.

   ........................................................................................................................

5. ඡායාරූප හා වීඩියෝ දර්ශන භාවිතයෙන් ඉදිරිපත් කිරීම් කළ හැකි මෙවලම කුමක් ද?

   ........................................................................................................................

## ක්‍රියාකාරකම - 2

**පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණු ද යොදන්න.**

1. මිනිසාගේ මූලික සන්නිවේදන ක්‍රමය කථනයයි. ☐
2. පෝස්ටර් යනු ඉදිරිපත් කිරීමේ මාධ්‍ය උපකරණයකි. ☐
3. යම් ඉදිරිපත් කිරීමක් ආකර්ෂණීය වීමට බහුවිධ මාධ්‍ය හේතු නොවේ. ☐
4. වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීමට උඩිස් ප්‍රක්ෂේපකය සුදුසු ය. ☐
5. පිටු පෙරළනය කැලැන්ඩරයක් වැනි උපකරණයකි. ☐

6. භූමිකා රංගන සඳහා මානව සම්පත් උපයෝගී කර ගත යුතු නැත.

7. සිදත් සඟරාව යනු පැරණි ව්‍යාකරණ ග්‍රන්ථයකි.

8. තාක්ෂණික උපකරණ භාවිතයෙන් ඉදිරිපත් කිරීම් පහසු කෙරේ.

9. නිර්මාණාත්මක රචනා බිත්ති පුවත්පතක පළ කළ හැකි ය.

10. සඟරාවක් පළ කෙරෙන්නේ කිසියම් නිශ්චිත අරමුණක් හෝ තේමාවක් පදනම් කර ගෙන ය.

11. යම් කාලීන ප්‍රස්තුතයක් පිළිබඳ තම ස්ථාවරය, ආකල්පය පුවත්පතක කතු වැකියකින් හෙළි කෙරේ.

12. එක් කලාපයක කතු වැකි එකකට වැඩි ප්‍රමාණයක් තිබිය හැකි ය.

13. එහි සමබර විවරණයක් දක්නට ලැබෙන අතර එය හරවත් විදග්ධ ලේඛනයකි.

14. කතුවැකිය ලිවිය යුත්තේ පුවත්පතේ හෝ සඟරාවේ ප්‍රධාන සංස්කාරකවරයා ම ය.

15. තීරු ලිපි රචනයේ දී ආරූඪ නම් භාවිත කිරීම දක්නට ලැබේ.

16. දයාසේන ගුණසිංහ මහතා වගතුග නමින් තීරු ලිපියක් රචනා කළේ ය.

17. පාඩමේ යොදා ඇති තීරු ලිපි දෙක ම චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ රචනා ය.

18. “බස් එක ” යන යෙදුම වහරට ගැනීම සුදුසු යැයි කුමාරතුංග මුනිදාස මහතා ලියා තිබේ.

19. පාඩමේ ඇතුළත් කතුවැකිය 1961 දී ලියන ලද්දකි.

20. “ ඇසේ මධුර ජීවනයේ ගීතා ” යනු ආනන්ද සමරකෝන් මහතාගේ ගීතයකි.

## ක්‍රියාකාරකම - 3

➢ **ඔබ මින් පෙර ඉගෙන ගත් විභක්ති පාඩමේ එක් එක් විභක්තිය දක්වමින් පිටු පෙරළනයක් සකස් කරන්න.**

## ක්‍රියාකාරකම - 4

➢ **සති අන්ත ජාතික පුවත්පත් දෙකක් ගන්න. එහි ඇතුළත් කතුවැකි හා තීරු ලිපි කපා ගෙන පොතේ අලවන්න.**

## ක්‍රියාකාරකම - 5

➢ **පහත සඳහන් තේමා උපයෝගී කරගෙන තීරු ලිපියක් හා කතුවැකියක් ලියන්න.**

<u>තීරු ලිපි මාතෘකා</u>

1. වසංගතයෙන් වසන් වෙමු.
2. පොත් මගේ නෙත් වගේ
3. මා බස හෙළ බස

<u>කතුවැකි මාතෘකා</u>

1. ළමා අපයෝජනය පිටු දැකීමට නම්
2. සමාජ මාධ්‍ය හා ශිෂ්‍ය පරපුර
3. පුද්ගල විනය හා සමාජ විනය

## <u>පිළිතුරු</u>

### <u>ක්‍රියාකාරකම් -1</u>

1. පෝස්ටරය
2. පිටු පෙරළනය
3. භූමිකා රංගන
4. උභිස් ප්‍රක්ෂේපකය
5. බහුවිධ ප්‍රක්ෂේපකය

### <u>ක්‍රියාකාරකම - 2</u>

| | | | |
|---|---|---|---|
| **1** | √ | **11** | √ |
| **2** | √ | **12** | × |
| **3** | × | **13** | √ |
| **4** | × | **14** | × |
| **5** | √ | **15** | √ |
| **6** | × | **16** | × |
| **7** | √ | **17** | √ |
| **8** | √ | **18** | × |
| **9** | √ | **19** | × |
| **10** | √ | **20** | √ |

- **ක්‍රියාකාරකම් 3, 4, 5 ප්‍රායෝගික ක්‍රියාකාරකම් බැවින් ඔබ එහි නිරත විය යුතු ය.**